විදේශ රැකියා සඳහා පිටත්වයාමේ අපේක්ෂාවෙන් පසුවන රාජ්‍ය සේවකයින්ට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිවීමට අවස්ථාව ලබාදී ඇති බවත්, කාර්යාංශයේ වෙබ් අඩවියට පිවිස තමන්ගේ තොරතුරු ඇතුළත් කිරීමට හැකි බවත් කම්කරු සහ විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මහතා පැවසුවේය.

රටට අවශ්‍ය විදේශ විනිමය ගෙන්වා ගැනීම සඳහා වන කඩිනම් වැඩසටහනක්, කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් ආරම්භ කර ඇති අතර ඒ අනුව රාජ්‍ය සේවකයින්ට විදේශ රැකියා සඳහා පිටත්ව යාමට අවස්ථාව ලබාදීමට අවශ්‍ය පියවර ගන්නා බව ඇමැතිවරයා පැවසුවේය.

රාජ්‍ය සේවකයාගේ විශ්‍රාම වැටුපට සහ ජ්‍යෙෂ්ඨත්වයට බාධාවක් ඇති නොවන ආකාරයට විදේශ ගතවීමේ අවස්ථාව ලබාදීමට අවශ්‍ය චක්‍රලේඛ නිකුත් කිරීම මැදිහත්වෙමින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සමග සාකච්ඡා කිරීමට තමන් අපේක්ෂා කරන බවද ඇමැතිවරයා සඳහන් කළේය.

රාජ්‍ය සේවකයින් විදේශ ගත කිරීමේදී, ඔවුන්ට අවශ්‍ය රැකියා අවස්ථාවන් සොයා ගැනීමේදී විදේශ රැකියා නියෝජිතආයතන සඳහා විශාල කාර්යභාරයක් පැවරෙන බවද, වදේශ රැකියා නියෝජිත ආයතන හිමිකරුවන් සමග අද උදෑසන පැවති සාකච්ඡාවකදී ඇමැතිවරයා කීවේය

එහිදී වැඩිදුරටත අදහස් දැක්වූ මනුෂ නානායක්කාර ඇමැතිවරයා මෙසේද පැවසුවේය.

රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා විදේශ රැකියා සඳහා අවස්ථා ලබාදෙනවා. රාජ්‍ය සේවකයාගේ ජ්‍යෙෂ්ඨත්වයට, විශ්‍රාම වැටුපට බල නොපාන අයුරින් ඔවුන්ට විදේශ ගතවීමට අපි අවස්ථාව ලබාදෙනවා. ඒ සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශ සමග අපි සාකච්ඡා කරලා අවශ්‍ය චක්‍රලේඛ නිකුත් කිරීමට කටයුතු කරනවා.

එහිදී රාජ්‍ය සේවකයින්ගෙන් විදේශ රැකියා සඳහා පිටත් කරන්නේත් ඔවුන් විදේශ රැකියා ගත කිරීම භාරවන්නේත් විදේශ රැකියා නියෝජිත ආයතනවලටයි. ඒකට අවශ්‍ය රැකියා වෙළඳපොල සොයාගෙන ඔවුන විදේශ ගත කිරීමෙ වැඩපිළිවෙලට සහාය ලබාදෙන්න

විදේශ ගත වීමට කැමැති රාජ්‍ය සේවකයින්ට විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවියට පිවිස තමන්ගේ තොරතුරු ඇතුළත් කිරීමට හැකියාව තිබෙනවා . ඒ ඒ රැකියා අවස්ථාවන් ගැන මෙන්ම එ සඳහා තිබිය යුතු සුදුසුකම් ඉදිරියේදී එම වෙබ් අඩවියේම ප්‍රසිද්ධ කරනවා.

මුලු රටේම විදේශ ගත විමට රාජ්‍ය සේවකයින් කැමැත්තෙන් සිටියදී, එයට සහාය ලබාදෙන්නේ ඔබලා. ඒ ජාතික වගකීමටත් ඔබගේ දායකත්වය ලබාදෙන්න.